**වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව**
**වවුනියාව දිස්ත්‍රික්කය**
-----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය **ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කල මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
-----------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කල ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). ප්‍රාදේශීය සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි අයිතම 07 ක වටිනාකම, තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ). රු. මි. 2.5 ක ස්ථාවර තැන්පතුව සඳහා 2015, 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු පොළිය පිළිවෙලින් රු.65,384 ක්, රු.185,000 ක් සහ රු.185,000 ක් ගිණුම්ගත කර නොතිබීම නිසා පොලී ආදායම සහ ලැබිය යුතු පොළී ආදායම එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ). බැංකු ශේෂ සනාථන ලිපි අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 07 ක ශේෂයන්ගේ එකතුව රු. 7,477,450 ක් වුවත් එය රු. 7,509,145 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමෙන් රු. 31,695 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය තුල ලද රු.446,602 ක හිඟහිටි උසාවි දඩ ආදායම වර්ෂයේ උසාවි දඩ ආදායම ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ උසාවි දඩ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.3** ලැබිය යුතු ගිණුම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු රු. 2,409,642 ක් වූ අතර එම වටිනාකම තුල වසර 01 සිට වසර 06 ක කාලයක සිට හිඟව තිබූ වටිනාකම රු. 1,909,642 ක් විය.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වෙනත් ආදායම් රු.440,870 ක් වූ අතර එම වටිනාකම තුල වසර 01 සිට වසර 08ක කාලයක සිට හිඟව තිබූ වටිනාකම රු.357,920 ක් විය.

(ඇ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු. 161,550 ක්වූ අතර,එම වටිනාකම තුල වර්ෂ 05 ට වඩා වැඩි රු. 21,600 ක් හා වසර 02 ත් 03 ත් අතර රු. 50,000 ක් විය.

**1.3.4** **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). රු. 1,014,810 ක් වූ පුස්තකාල පොත් වල වටිනාකම සනාථ කිරීමට අදාල වටිනාකම් දැක්වෙන විස්තරාත්මක උප ලේඛණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ). රු.91,176,811 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය තහවුරු කිරීමේ ලිපි ලේඛන විගනණය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.5** අනුකූල නොවීම්

-------------------

**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ). | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | |
| | 126 (X) (ආ) වගන්තිය | - | බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙන්දන් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |
| (ආ). | 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | |
| | 5(7) රීතිය | - | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි |

| | | |
|---|---|---|
| 65 රීතිය | - | ගෙවීම් සඳහා වූ කාල සීමාව අවසානයේ ආදායම් ලිපිකරු ගෙවීම් පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 152 රීතිය | - | ප්‍රා.ස. 6 අනුව මාසික ලැබීම් ප්‍රකාශයක් පවත්වා නොතිබුණි. |
| 155 රීතිය | - | ප්‍රා.ස.10 අනුව ප්‍රධාන මුදල් පොත පවත්වා නොතිබුණි. |
| 159 රීතිය | - | ප්‍රා.ස.15 අනුව මාසික ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය පවත්වා නොතිබුණි. |
| 165 රීතිය | - | ප්‍රධාන ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි. |
| 169 රීතිය | - | ප්‍රා.ස.40 හා 43 අනුව පිළිවෙලින් ඇස්තමේන්තු ලෙජරය හා වැඩ විස්තර මිනුම් පොත පවත්වා නොතිබුණි. |
| 180 රීතිය | - | මුදල් හෝ ගබඩා කටයුතු භාරව ක්‍රියා කරන නිලධාරීන් හෝ ආදායම් එකතු කිරීමේ කටයුතු හා සම්බන්ධ රාජකාරී ඉටු කරන නිලධාරීන් විසින් ඇප තැන්පත් කල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| 193 රීතිය | - | අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන හා පරිපුරක සම්මත සසඳා බලනකල එක් එක් ආදායම් විෂයයන් යටතේ හා එක් එක් වැය විෂයය යටතේ ප්‍රකාශයන්, අතිරික්තයන් හෝ වියදම් නොකොට ඉතිරිව ඇති ශේෂය පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයන්ද සමඟ සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| 217 රීතිය | - | පී.එස්. 46 අනුව සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා හා කුළියට දෙන ලද සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

(ඇ).

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

--------------------------------

| | | | |
|---|---|---|---|
| | මුදල් රෙගුලාසි 570 | - | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳව ලැයිස්තු සකස් කර විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| | මුදල් රෙගුලාසි 571(2) හා (3) | 508,838 | ඉකුත් වූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීම හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීම සිදුකල යුතු වුවත් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | භාණ්ඩාගාර චක්‍රලේඛ<br>------------------------- | | |
| I | කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA /2009 (2) දරණ චක්‍රලේඛය | - | අභ්‍යන්තර විගණන නිළධාරියා විසින් තම ආයතනයේ වත්කම් වාර්තා තබා ගැනීමේ ප්‍රමාණාත්මක භාවය පිළිබඳව පරීක්ෂා කිරීම සිදු කල යුතුය. එලෙස කටයුතු නොකිරීම නිසා සභාවේ ස්ථාවර හා පරිගණක මෘදුකාංග හා උපාංග පිළිබඳ ලේඛණ යනාදිය නඩත්තු නොකරන බව අණාවරණය විය. |
| II | කළමණාකරන විගණන දෙපාර්තුමේන්තුවේ 2012 ජනවාරි මස 13 දිනැති අංක DMA/2012 /101 දරණ චක්‍රලේඛය | - | අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා පරිගණක ගත තොරතුරු පද්ධතියක් තුල (CIS) අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීම සිදු කලයුතු බවට මාර්ගෝපදේශ හා ප්‍රශ්ණාවලියක් හඳුන්වා දී තිබුණද අභ්‍යන්තර විගණන නිළධාරියා අදාල චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය<br>---------------------------------- | | |
| | 1985 ජුනි 03 වන දිනැති අංක 293 දරන චක්‍රලේඛයේ 3.19 දරණ ඡේදය | 1,533,000 | සේවයෙහි ස්ථිර කර නොමැති නිළධාරියෙකු ණය මුදලක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු විශේෂ සහතිකය නොමැතිව සභාව විසින් 2015, 2016 සහ |

සමාලෝචිත වර්ෂය සඳහා ආපදා ණය නිළධාරීන් 25 දෙනෙකුට ලබා දී තිබුණි.

(ඊ). උතුරු පළාත් මුදල් රෙගුලාසි සංග්‍රහය
------------------------------------

මුදල් රෙගුලාසි 101 - සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම හා අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 4,296,770 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු. 1,691,900 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදාම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ii | කුලී | 906,000 | 3,959,000 | 490,300 | 395,900 | 756,000 | 65,550 | 161,650 | 65,550 |
| iii | බලපත්‍ර ගාස්තු | 1,000,000 | 132,209,950 | 132,209,950 | 5,242,042 | 700,000 | 1,093,600 | 1,093,600 | 1,093,600 |
| iv | වෙනත් ආදායම් | 5,738,000 | 5,242,042 | 5,242,042 | 5,242,042 | 12,218,500 | 5,270,499 | 5,270,499 | 5,270,499 |
| | | 5,738,000 | 141,410,992 | 137,942,292 | 10,879,984 | 13,674,500 | 6,429,649 | 6,525,749 | 6,429,649 |

**2.2.2** **කුලී**

**----**

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර කුලී, යටත් පිරිසෙයින් වසර 5 කට වරක් වත් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවා සංශෝධනය කලයුතු වුවත් අවුරුදු 07 කට වැඩි කාලයක සිට තක්සේරු කරනු ලැබූ කුලී පදනම් කරගෙන මිල ගණන් කැඳවා සභාව සතු කඩකාමර 13 ක් කුලියට දී තිබුණි.

**2.2.3** **බලපත්‍ර ගාස්තු**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2006 සහ 2016 සිට ස්ථාපිත දුරකථන කුළුණු දෙකකින් වෙළඳ බලපත්‍ර ගාස්තු වසරකට රු.3,000 බැගින් සමාලෝචිත වර්ෂය දක්වා රු.42,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාමඩුව ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත් දුරකථන කුළුණ 2006 ජුනි 20 දින ස්ථාපිත කර තිබුණද ඒ වෙනුවෙන් අයවිය යුතු රු. 210,000 ක ස්ථාපිත ගාස්තුව අය කිරීමට කටයුතු කර නොතිබුණි.

ඇ). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන, පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබාගතයුතු ව්‍යාපාරික ස්ථාන සම්බන්ධයෙන් සභාව විසින් හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි.

**2.2.4** **වෙනත් ආදායම්**

------------------

සභා බල ප්‍රදේශය තුළ පිහිටි නළ ළිං 204 ක් නිසි නඩත්තුවක් සිදුකර නොතිබීම නිසා හා වර්ෂ කිහිපයක සිට ගාස්තු අයකර ගැනීමකින් තොරව පැවතුණි.

**2.2.5** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

**(අ)** **උසාවි දඩ**

**----------**

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයෙන් දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු. 1,570,358 ක් විය.

(ආ) **මුද්දර ගාස්තු**

---------------

මුද්දර ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු. 2,409,642 ක් විය.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1** **කාර්යසාධනය**

**-------------**

**ඝන අපද්‍රව්‍ය කළමණාකරණය**

**----------------------------------**

ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, වෙන්කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම සම්බන්ධව වැඩ පිළිවෙලක් සකස් කර නොමැති බවට නිරීක්ෂණය විය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). ප්‍රාදේශීය සභාවේ මෙහෙවර ප්‍රකාශය අනුව සභාව විසින් බල ප්‍රදේශයේ පූර්ණ සංවර්ධනයක් හා ප්‍රතිලාභ පොදු මහජනතාවට ලබා දීමට කටයුතු කළ යුතු වුවත් ප්‍රමාණවත් අරමුදල් සභාව සතුව පැවතියදීත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කර නොතිබුණු අතර, 2016 වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු. 34,702ක් හා රු. 391,672 ක් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබුණි.

(ආ). 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු 04 ක් හා වෙනත් තනතුරු 07 ක් මේ වන තෙක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). 2017 මැයි 30 දින රු. 24,800 ක වියදමක් දරා මිලදී ගෙන තිබූ ඇඟිලි සළකුණු යන්ත්‍ර දෙක 2018 අප්‍රේල් 18 දින වන විටත් මාමඩුව පුස්තකාලය හා ආයුර්වේද මධ්‍යස්ථානයට සහ පෙරිය උළුක්කුලම පුස්තකාලයට සවි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ). සභාව සතු සංචිත වාහන 35 න් වාහන 34 ක් සඳහා සමාලෝචිත වර්ෂයට ආදායම් බලපත්‍ර හා වාහන 14 ක් සඳහා රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

---

(අ). **නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

I) භාවිතයට ගතහැකි ට්‍රැක්ටර් 10 ක් නිෂ්කාර්යව රඳවා තබාගෙන තිබුණි.

II). 2013 වර්ෂයේදී රු. 4,237,251 ක් වැයකර සතිපොළවල් 3ක් ඉදිකර තිබූ නමුත් 2018 මාර්තු 31 දින වන විටත් ඒවා මහජනතාවට විවෘත කර නොතිබුණි.

III). වාහන සහ යන්ත්‍ර සූත්‍ර 30ක් සභාව සතුව ඇතත් එකී සියලුම වාහන ධාවනය කිරීම සඳහා එක් රියදුරකු පමණක් සභාවට අනුයුක්තව තිබුණි.

(ආ) **අළුත්වැඩියා හා නඩත්තු සිදු නොකිරීම**

---

ප්‍රාදේශීය සභාව සතු සංස්කෘතික මධ්‍යස්ථානය ප්‍රමාණවත් පරිදි නඩත්තු නොකිරීම නිසා ගොඩනැගිල්ල හා උපකරණ විනාශ වෙමින් පැවතුනි.

(ඇ). **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

---

2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ භාණ්ඩ 13 ක් සම්බන්ධයෙන් කල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7 ජේදයට අනුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය තුළ වෙනත් ආයතනයක ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳ ව දැනුම ඇති එක් නිළධාරියෙකු විය යුතු වුවත් ඊට පටහැනිව කමිටුවේ සියළුම නිළධාරීන් ප්‍රාදේශීය සභාවෙන් පත්කර තිබුණි.

(ආ). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.01 ජේදයට අනුව රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී තාක්ෂණික කමිටුවක් පත්කළ යුතු වුවත්,අවස්ථා 03 කදී රු.2,509,600 ක භාණ්ඩ මිල දී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණි.

(ඇ). මිල ගණන් කැදවීමේ ලංසු ලිපියේ අවශ්‍ය කරන භාණ්ඩවල ප්‍රමාණයන් සඳහන් කළ යුතු වුවත් ඊට පටහැනිව අවස්ථා 16 කදී රු.5,749,380 ක වටිනාකමැති භාණ්ඩ හා උපකරණ මිලට ගැනීමේදී එක් භාණ්ඩයක් සඳහා පමණක් මිල ගණන් කැදවීම නිසා ලබා ගැනීමට තිබුණු වට්ටම් වාසිය සභාවට අහිමි වී තිබුණි.

(ඈ). අවස්ථා 16 කදී රු.5,749,380 ක් වටිනා භාණ්ඩ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ලියවිලි ලියාපදිංචි කළ ආකාරය හා ලංසු ලියවිලි සැපයුම්කරුවන් වෙත දන්වා යැවූ ආකාරය පිළිබඳව ලිඛිත සාක්ෂි ලංසු ලැබුණු ආකාරයත් විවෘත කළ ආකාරය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර තිබූ බවට කිසිදු සාක්ෂි නොතිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

**මඩුකන්ද සංස්කෘතික මධ්‍යස්ථාන මාර්ගය තාර දැමීම.**

-------------------------------------------------------

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන(PSDG) යටතේ රු. 1,469,902ක් වැය කර ඉදිකල මඩුකන්ද සංස්කෘතික මධ්‍යස්ථාන මාර්ගය 2018 අප්‍රේල් 17 දින භෞතික පරීක්ෂාවේදී ඇස්තමේන්තුවට අනුව පාදමේ එක් පසක පළල මීටර් 0.75 ක් ලෙස තිබිය යුතු වුවත් මීටර් 0.35 ත් 0.6ත් අතර පරාසයකට පාදම දමා තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

**පිළිතුරු නොදුන් විගණන විමසුම්**

----------------------------------

2015 වර්ෂයට අදාළ විගණන විමසුම් දෙකකටද 2016 වර්ෂයට අදාළ විගණන විමසුම් තුනකට 2018 මැයි 03 දින වන විට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | --------- | ---------- |
| (අ) | ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| (ආ) | වත්කම් පාලනය | නිෂ්කාර්යව පැවතීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම |
| (ඈ) | වාහන පාලනය | රියදුරන් නොමැතිවීම |
| (ඉ) | අභ්‍යන්තර පාලනය | I. නිත්‍ය යන්ත්‍ර ක්‍රියාකරුවන් නොමැතිවීම<br>II. නීති,රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම |